# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2370/05 – 2024 පෙබරවාරි මස 06 වැනි අඟහරුවාදා – 2024.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/39.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.02.22 දිනැති හා අංක 2320/52 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2023.02.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දෙහිවල, කළුබෝවිල, පන්සල පාර, අංක 26/6 ලිපිනයෙහි පදිංචි කේ. ඒ. ආර්. පෙරේරා මහතා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/26/2023 හා 2023.12.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටාතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (රා. ආ.)

2024 ජනවාරි මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 01.


1A – G 041370 – 18(2024/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය

1 කේ. ඒ. ආර්. පෙරේරා මයා,
අංක 26/6,
පන්සල පාර,
කළුබෝවිල, දෙහිවල.

*අයි. ආර්. ගොනු අංකය ඃ අයි./ආර්./කොම්. 03/2020/39*
*බේරුම්කරණ නඩුඅංකය ඃ ඒ/26/2023*

*පළමුවැනි පාර්ශ්වය.*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ - 05.

දෙවන පාර්ශ්වය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 දරණ හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරණ පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රති සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය ප්‍රකාරව ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාරේ අංක 117 හි පදිංචි සිරි සිංග ජ්පුලි වන මා පත්කොට ඇත.

**බේරුම් කළ යුතු කරුණු**

කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ අංක අයිආර්/කොම්/03/2020/39 සහ 2023.02.06 දිනැති යොමුවෙන් දක්වා ඇති පරිදි බේරුම් කළයුතු කරුණු වනුයේ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවය කළ කේ. ඒ. ආර්. පෙරේරා නමැති අයට පහත සඳහන් කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමි විය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.

1. 2001.12.13 සිට වැඩ තහනම්කර විනය පරික්ෂණයක් සිදු නොකිරීම.

2. වැඩ තහනමට හේතු වූ අල්ලස් චෝදනාවෙන් අධිකරණය විසින් නිදොස් කොට නිදහස් කර තිබියදී සේවකයාට සහනයක් ලබාදීමට කටයුතු නොකිරීම.

3. 2001.12.13 දින සිට 2009.08.05 විශ්‍රාමික දින දක්වා වැටුප හා වාර්ෂික වේතනාධිකය හිමි නම් එය ලබා නොදීම.

**පාර්ශ්වයන් වෙනුවෙන් පෙනී සිටීම**

අදාල බේරුම්කරණ ක්‍රියාවලියේදී ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වය වෙනුවෙන් කේ. පියසේන පෙරේරා යන අයද දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ විනීෂා ෆර්නැන්ඩස්, නීති නිලධාරි දිමුතු පනංගල යන අය ද පෙනී සිටින ලදී.

**ආරාවුලේ පසුබිම**

පළමු පාර්ශ්වයේ 2023.03.02 දින දරන ප්‍රථම කරුණු දැක්වීම අනුව එම පුද්ගලයා 1978.02.27 දින ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවයට බැදී ෆෝමන් තනතුර දක්වා උසස්ව සේවයේ යෙදී සිටින අතර මණ්ඩලයේ ප්‍රධාන සිවිල් ඉංජිනේරු ගේ 2001.12.03 සහ ඊසී/විනය/19/2001 දරන ලිපිය අනුව වැඩ තහනම් කිරීමකට ලක් වී ඇත. මෙකී වැඩ තහනම සිදුකර ඇත්තේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (විමර්ශන) ගේ අංක ආර්/107/2001 හා 2001.11.19 දින දරන ලිපිය පදනම් කරගෙන බව එම ලිපියෙන් දක්වයි.

වැඩ තහනම් කිරීමෙන් පසු පළමු පාර්ශ්වය වෙත චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර හෝ එවැන්නකු සම්බන්ධයෙන් පැවැත්විය යුතු අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පවත්වා නොමැත.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මෙම කාරණයට අදාලව නඩු අංක බී 1396/02 දරණ යටතේ කොළඹ මහාධිකරණය හමුවේ නඩු පවරා ඇති අතර එම නඩුව විභාග කිරීමෙන් අනතුරුව නඩුවේ දෙවන විත්තිකරු වූ පළමු පාර්ශ්වකරු 2014.09.30 දින ඔහු වෙත එල්ල කරන ලද චෝදනා දෙකෙන්ම නිදොස් කොට නිදහස් කර ඇත.

එසේ නිදහස් කිරීමෙන් අනතුරුව ඊට අදාල නඩු තීන්දුවේ පිටපතක් 2014.10.20 දින ලංගම ප්‍රධාන සිවිල් ඉංජිනේරු වෙත ඉදිරිපත් කර තම හිග වැටුප් ලබා දෙන ලෙස ඉල්ලා ඇතත් අපේක්ෂිත කාලය තුළ එම ලිපියට පිළිතුරක් නොලද හෙයින් සේවය නතර කළ 2001.12.03 දින සිට විශ්‍රාම ගත යුතු දිනය වන 2009.08.05 දින දක්වා තමාට හිමි හිඟ වැටුප් ලබා දෙන ලෙස ඉල්ලා 2016.03.30 දින කර්මකරු කොමසාරිස්වරයා ගෙන් ඉල්ලා ඇත.

දෙවන පාර්ශ්වය 2023.04.04 දින දරන ප්‍රකාශයේ අංක 01 යටතේ පළමු පාර්ශ්වය කම්කරු පැමිණිල්ල ගොනු කර ඇත්තේ විශ්‍රාම වයස ඉක්ම යාමෙන් පසුව වන නිසා පළමු පාර්ශ්වය සහ දෙවන පාර්ශ්වය අතර සේව්‍ය සේවක සබඳතාවයක් හෝ සජීවී ආරාවුලක් නොමැති හෙයින්ද,

එම ප්‍රකාශයේ අංක 6 යටතේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල විනය ව්‍යවස්ථා මාලාවේ අංක 6.1 වගන්තිය අනුව අල්ලස් ලබා ගැනීම වැනි චෝදනා එල්ලවී ඇති අවස්ථාවක වැටුප් රහිතව සේවකයාගේ සේවය තහනමට ලක් කිරීම නීතිඎනුකූල ක්‍රියාවක් වන හෙයින්ද එහි අංක 8 යටතේ දෙවන පාර්ශ්වයට එරෙහිව පළමු පාර්ශ්වයට නඩු නිමිත්තක් උපචය වී නොමැති හෙයින් ද මෙම නඩුව මුල් අවස්ථාවේදීම නිෂ්ප්‍රභ කරන ලෙස මූලික විරෝධතාවයක් දක්වා ඇත.

**තීන්දුව ලබාදීමේදී සළකා බලා ඇති කරුණු**

සේව්‍ය සේවක සබඳතාවයක් හෝ සජීවී ආරාවුලක් නොපැවති බව දක්වා මෙය නිෂ්ප්‍රභ කරන ලෙස දෙවන පාර්ශ්වය ඉල්ලා ඇති හෙයින් ඒ සම්බන්ධයෙන් නිරීක්ෂණය කරන ලදී.

කාර්මික ආරාවුල් පනතේ 48 වගන්තිය "සේවකයා" යන වදන අර්ථ නිරූපනය කරමින් දක්වන්නේ යම් නිශ්චිත අවස්ථාවකදී සේවයේ යෙදී සිටියද නොසිටියද සාමාන්‍යයෙන් එවැනි යම් ගිවිසුමක් යටතේ සේවයේ යොදවනු ලැබූ යම් තැනැත්තකු මෙන්ම සේවය අවසන් කරනු ලැබ ඇති යම් තැනැත්තකුද "සේවකයකු" යන අර්ථකථනයට ඇතුළත් වන බවය.

අදාල සේවකයා සම්බන්ධයෙන් පවතින සේව්‍ය සේවක සබඳතාවය සහ ගිවිසුම ශූන්‍ය බවට පත්වනු සඳහා කී ගිවිසුම නිර්බල කරමින් එම සේවකයා නෛතික වශයෙන් විශ්‍රාම ගන්වා තිබිය යුතු වුවත් දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය මෙහිදී එවැනි පියවරකට අනුගතව නැත. වැඩ තහනම් කිරීමෙන් පමණක් සේවකයකු සමග ඇති සබඳතා නිම නොවන හෙයින් පළමු පාර්ශ්වය දෙවන පාර්ශ්වය සමග පැවති සේවක සබඳතාවය අහෝසි වී ගොස් ඇති බවක් බේරුම්කරණ අධිකරණය නොපිළිගනියි.

වැඩ තහනමට ලක්ව සිටි සේවකයා නඩුවෙන් නිදහස් වී යළි සේවයට යාමට අපේක්ෂාවෙන් කල් ගත කර ඇතද නිවැරදිකරු බවට තීරණය කර ඇති අධිකරණ තීන්දුව ලැබී ඇත්තේ විශ්‍රාම යාමේ වයස ඉක්මවා යාමෙන් පසුවය. ඒ සමගම සිය සේව්‍යයා නියම කර තිබූ පරිදි ඒ බව දක්වමින් නීතිය පිළිගන්නා ආකාරයට දෙවන පාර්ශ්වය අමතා ඇතත් ඊට පිළිතුරක් නොලත් හෙයින් කම්කරු කොමසාරිස් වරයාගේ පිහිට පතා ඇත. එහෙයින් මෙය සජීවී ආරාවුලක් නොවන බවට දක්වන විරෝධය ප්‍රතික්ෂේප කරයි.

යම් වරදක් වැළැක්වීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් සහනයක් ලබා ගැනීම සඳහා හෝ නඩුවක් පැවරිය හැකිවේද ඒ වරදය. තවද අයිතිවාසිකමක් ලබා නොදීම, බැඳීමක් ඉටු කිරීම ප්‍රතික්ෂේප කිරීම, යුතුකමක් ඉටු කිරීම පැහැර හැරීම ආදී කරුණු ශ්‍රී ලංකා නීතිය හමුවේ නඩු නිමිත්තක් ලෙස පිළිගනියි. එහෙයින් වැඩ තහනමට ලක්ව සිටි පළමු පාර්ශ්වය නිදොස් වීමෙන් පසු දෙවන පාර්ශ්වය වෙත ඒවා ඇති ලිපියට පිළිතුරක් සපයන්නට ක්‍රියාකර නොමැති වාතාවරණයක් තුළ පිළිසරණක් පතා කම්කරු කොමසාරිස්වරයා වෙත පැමිණිළි කර තිබීම නඩු නිමිත්තක් උපචය නොවන බවට දක්වන මූලික විරෝධය බේරුම්කරණ අධිකරණය පිළි නොගනී.

ඒ අනුව නඩුව නිශ්ප්‍රභ විය යුතු බවට ඉදිරිපත් කළ මූලික විරෝධයන් බැහැර කර ඇත. විරෝධයන් සළකා ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට දිනයක් ලබා දෙන ලෙස දෙවන පාර්ශ්වය 2023.05.24 දින නඩු දිනයේදී ඉල්ලා සිටියද සාක්ෂි විභාග කොට ලිඛිත දේශනවලට

යාම සුදුසු බව පෙනී ගිය හෙයින් මෙම ආරාවුලට අදාලව කාර්මික සබඳතා අංශයේ ඇති අයි/ආර්/කොම්/03/2020/39 ගොනුව සහ සීඊ/ඞී9/131බී /2016 උප ගොනුව කැඳවා වැඩිමනත් තොරතුරු ලබා ගැනීමටත් යහපත් බේරුම්කරණයක් සඳහා නඩුව පවත්වාගෙන යාමටත් තීරණය කරන ලදී.

2023.10.24 නඩු විභාග දින දෙවන පාර්ශවයේ සාක්ෂිකරුගෙන් අධිකරණය මෙසේ විමසීය. ( 2023.10.24 නඩු විභාග සටහන් 09 වන පිට)

**අධිකරණය**

ප්‍ර. වැඩ තහනම් කිරීම සහ සේවය අවසන් කිරීම දෙකක්ද එකක්ද ?

පි. සේවය අවසන් කිරීමයි වැඩ තහනම් කිරීමයි කියන්නෙ දෙකක් ස්වාමීනි

ප්‍ර. වැඩ තහනම් කළාට පස්සෙ සේවකයකු ගැන සොයා බලන්නෙ නැද්ද?

පි. විභාගයක් පවත්වන්න හැකියාවක් පවතී නම් සොයන්න ඕන

ප්‍ර. ප්‍රධාන සිවිල් ඉංජිනේරු ලිපියක් නිකුත් කරල තියනව සේවකයගෙ වැඩ තහනම් කරමින් 2001 දෙසැම්බර් 03 වන දින. පළමු ඡේදයේ තිබෙන්නෙ සේවය තහනම් කරනව කියන එක. දෙවන ඡේදයේ තිබෙනවා ඔබට විරුද්ධව ඇති නීති කෘතිය අවසන් වූ වහාම උසාවි නඩු වාර්තාවේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කරන්න. මොකක්ද මේකෙන් අදහස් කරන්නෙ ?

පි. මේ කියන්නේ මොහු සම්බන්ධයෙන් පවතින අල්ලස් කොමිසම විසින් අධිකරණයේ පවත්වන නඩුව අවසන් වුනාට පස්සෙ මේ සේවය තහනම් කිරීම ගැන සළකා බලන්න නඩු වාර්තාවේ කොපියක් ඉදිරිපත් කරන්න කියල නමුත් ඒ වන විට ඔහු විශ්‍රාම ගිහිල්ල තියනව.

ප්‍ර. විශ්‍රාම ගියා කියල කියන්න ලිපියක් තියනවද?

පි. නැහැ

වැඩ තහනම් කිරීමෙන් පසු දෙවන පාර්ශ්වය සේවකයා සම්බන්ධයෙන් කිසිදු තීරණයකට එළැඹ නොමැති බව එම සාක්ෂිය තහවුරු කළේය.

එසේ වුවද 23.11.14 දින කම්කරු කොමසාරිස් කාර්යාලයට ලැබී ඇති දෙවන පාර්ශ්වයේ ලිඛිත දේශනයේ අංක 9 යටතේ දක්වා ඇත්තේ 2009.08.05 දිනට වයස අවු 55 සම්පූර්ණ වීම හේතුවෙන් දෙවන පාර්ශ්වය මණ්ඩලයේ සේවයෙන් විශ්‍රාම ගන්වා ඇති බවයි. එහෙත් එවැනි විශ්‍රාම ගැන්වීමක් සිදු කර ඇති බව තහවුරු කර නැත.

එම ලිඛිත දේශනයේ 10.1 යටතේද 2009.08.05 දින සිට මෙම සේවකයා විශ්‍රාම ගන්වා සියළු ව්‍යවස්ථාපිත දීමනා ගෙවා අවසන් බව දක්වා තිබේ. එහෙත් 2023.10.24 දින නඩු විභාගය හමුවේ අධිකරණය ප්‍රශ්ණ කරන විට දෙවන පාර්ශවයේ සාක්ෂිකරු පවසා ඇත්තේ අදාල සේවකයාගේ වැඩ තහනම් කර ඇති බවත් පසුව ඒ ගැන සොයා බලන්නට අවස්ථාව නොලද බවත් ඔහු විශ්‍රාම ගිය බව සනාථ කරන්නට ලේඛනයක් ඉදිරිපත් කරන්නට නොමැති බවත් ය.

2023.05.24 දින පැවති නඩු විභාගය හමුවේ දෙවන පාර්ශ්වයේ නීතිඥවරිය " කම්කරු ආරාවුල් පනතේ 19 වන වගන්තියට අනුව බේරුම්කරුවකු විසින් දෙනු ලබන ප්‍රදානයක් සේවා යෝජකයා සහ සේවකයා අතර පවතින සේවා ගිවිසුමේ කොන්දේසියක් බවට පත්වන බැවින් සේවකයා විශ්‍රාම ගන්වා ඇති විටකදී එවැනි නඩු කටයුත්තක් සම්බන්ධයෙන් බේරුම්කරුවකු විසින් යම් ප්‍රදානයක් කළද තවදුරටත් පාර්ශ්වයන් අතර සේවා ගිවිසුමක් නොපවතින නිසා එකී ප්‍රදානය බලාත්මක කිරීමේ හැකියාවක් නොපවතී යනුවෙන් දක්වා ඇතත් එම ප්‍රකාශය කාර්මික ආරාවුල් පනතේ 111 කොටසේ 19 වගන්තිය නිර්වචනය කිරීම මත ස්ථාපනය වන්නේ නැත.

පනතේ 19 වන වගන්තිය දක්වන්නේ මෙසේය. කාර්මික ආරාවුලක් සම්බන්ධයෙන් බේරුම්කරුවකු විසින් දෙන ලද්දාවූ ද තත්කාලයෙහි වලංගුව ඇත්තාවූද සෑම ප්‍රදානයක්ම මෙම පනතේ කාර්යය සඳහා 17(2) වගන්තියේ

විධිවිධාන අනුකූලව ඒ ප්‍රදානයෙහි සඳහන් පාර්ශ්ව වෘත්තීය සමිති, සේවා යෝජකයින් සහ සේවකයින් අතරෙහි බැඳීමක් ඇති කරන ප්‍රදානයක් වන්නේය.

තවද ඒ තීරණයෙහි ඇතුළත් ඒ ප්‍රදානයෙන් බැඳී සිටින සේවා යෝජකයින් සහ සේවකයින් අතර ඇති සේවා ගිවිසුමේ ව්‍යවස්ථාපිත නියමයක් වන්නේය යනුවෙනි."

එමගින් පැහැදිළි වන්නේ බේරුම්කරුවකුගේ ප්‍රදානයක් බලාත්මක කළ නොහැකි බව නොව එවන් ප්‍රදානයක් සේව්‍ය සේවක දෙපක්ෂය අතර බැඳීමක් ඇති කරන බවත් එය තවදුරටත් සේවා යෝජකයින් සහ සේවකයින් අතර ඇති සේවා ගිවිසුමේ ව්‍යවස්ථාපිත නියමයක් බවට පත්වන බවත්ය. ප්‍රදානයක් ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්ශ්වය අතර ඇති සේවා ගිවිසුමේ කිසියම් බාධාවක් පවතී නම් බේරුකරුවකුගේ ප්‍රදානය එම බාධාව ඉවත්කර පහසුකම් සපයන මෙවලමක් බවට පත්වීමය.

පළමු පාර්ශ්වයේ මෙහෙයවීම මත සාක්ෂිකරු ගෙන් ප්‍රශ්න කිරීමේ දී පවසා ඇත්තේ තම අරමුණ හිඟ වැටුප් ලබාගැනීම පමණක් බවය. (2023.09.04 දින නඩු සටහන් පිටු අංක 05 සහ 06)

ප්‍ර. නඩු තීන්දුවේ පිටපතක් එක්ක ලංගමට ඉදිරිපත් කළා අභියාචනයක් රැකියාව දෙන්න කියල?

පි. ඔව්

ප්‍ර. තමුන්ට ලංගමයෙන් පිළිතුරක් ලැබුණද?

පි. කිසිම පිළිතුරක් මට ලැබුනෙ නැහැ

ප්‍ර. තමුන් නඩුවෙන් නිදහස් උනාට පස්සේ මොකද්ද කළේ ?

පි. මා ලංකා ගමනා ගමන මණ්ඩලයට ලිපි යැව්වා

**අධිකරණය**

ප්‍ර. ඔබ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට ලිපි යැව්වාද?

පි. ඔව්

ප්‍ර. ලිපි ශ්‍රී ලංගමයට යැව්ව කියල තහවුරු කරන්නෙ කොහොමද?

පි. ලිපිය සහ ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සිය තියනවා

සාක්ෂිකරු ප්‍රධාන ඉංජිනේරු තුමාට සහ සභාපති තුමාට පිටපත් යවමින් ලියන ලද ලිපිය ඒ 5 ලෙසත් එම ලිපිය සනාථ කරන ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සිය ඒ 5 ඒ ලෙසත් ලකුණු කර ගරු අධිකරණයට ඉදිරිපත් කර සිටිනවා.

පි. ඔව්

ප්‍ර. මේ ලිපි ලංගමට යැවුවාට පස්සෙ ඔබට පිළිතුරු ලැබුණද?

පි. කිසිම පිළිතුරක් ලැබුනෙ නැහැ

2014.10.30 දාතම දරන එම ලිපිය සහ කුවිතාන්සිය ඔප්පු කිරීමේ භාරයට යටත් කරන මෙන් දෙවන පාර්ශ්වය ඉල්ලා සිටින ලදී.

ප්‍ර. ඊට පස්සෙ කුමක්ද සිදු උනේ?

පි. මට කිසිම පිළිතුරක් ලැබුනෙ නැහැ. එම නිසා කම්කරු කාර්යාලයට පැමිණිලි කළා

දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනයේ අංක 34 යටතේ 1999 (2) එස්එල්ආර් 341 දරන නඩු තීන්දුවද දක්වමින් එහි අංක 33 හි දක්වා ඇත්තේ 2014.09.30 දින ලබා දී ඇති මහාධිකරණ නියෝගය රැගෙන 2023.03.02 දින බේරුම්කරණය හමුවට පැමිණ තිබීම තුළ ඉල්ලුම් පත්‍රයෙහි දැඩි ප්‍රමාදයක් සිදුව ඇති හෙයින් මෙය සාධාරණත්වයේ මූලධර්මවලට පටහැනි බවයි.

පළමු පාර්ශ්වය නිදොස් කොට නිදහස් කළ බව දක්වන නඩු තීන්දුව ලබා දී ඇත්තේ 2014.09.30 දින වන අතර සහන ඉල්ලා ලංගම ප්‍රධාන ඉංජිනේරු වෙත ලිපිය යොමු කර ඇත්තේ 2014.10.20 දිනය. එම ලිපියට දෙවන පාර්ශ්වයෙන් පිළිතුරක් ලැබෙන තෙක් බලා සිට එය නොලැබීම නිසා කම්කරු දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කර ඇත්තේ (පැ 4 ට අනුව) 2016.03.30 දිනය. ඊට අදාළ විභාගය පවත්වාගෙන යාමේ ප්‍රතිඵලයක් ලෙස මෙය බේරුම්කරණය වෙත යොමු කර ඇති අතර එය විභාගයට ගන්නා බව 2023.02.23 දින දරන ලිපියෙන් කම්කරු කොමසාරිස්වරයා අදාළ පාර්ශ්වයන්ට දන්වා ඇත.

කාර්මික ආරාවුල් පනතේ 44 (ඇ) වගන්තිය දක්වන්නේ මෙම පනත යටතේ යම් සේවා යෝජකයකුගෙන් යම් සේවකයකුට ලැබිය යුතු මුදල් ප්‍රමාණයක් අයකර ගැනීම සඳහා වූ නඩුවක් ඒ මුදල ඒ සේවකයාට ලැබිය යුතු දිනයෙන් පසු එළැඹෙන දෙවර්ෂය තුළදී පවරන ලද නම් එවැනි නඩුවක් පවත්වාගෙන යා හැකි බවය.

ඒ අනුව දෙවන පාර්ශ්වය වෙත දැනුම් දී සහනයක් නොලැබීම නිසා එසේ දන්වා දෙවසරක් ඉක්මවන්නට පෙර මෙම පැමිණිල්ල සිදුකර තිබීම කාර්මික ආරාවුල් පනතේ විධි විධානයන්ට එකඟ බව බේරුම් කරණය විශ්වාස කරයි. එසේම නඩුව හමුවේ ඉදිරිපත්ව කරුණු සහ ලිපි ලේඛන අනුවද එවන් ප්‍රමාදයක් සිදුව ඇති බව සනාථ නොවන හෙයින් මෙය සාධාරණත්වයේ මූලධර්මවලට පටහැනි බව පිළිගන්නට හේතු වන්නේ නැත.

**බේරුම් කරන තීන්දු ප්‍රකාශය හෙවත් ප්‍රදානය**

පළමු පාර්ශ්වකරුගේ වැඩ තහනම් කරන බව දක්වමින් 2001.12.03 දින දරන ලිපිය අත්සන් කර ඇත්තේ ශ්‍රීලංගම ප්‍රධාන සිවිල් ඉංජිනේරුවරයා විසිනි.

එහි දෙවන ඡේදය සඳහන් කරන්නේ "ඔබට විරුද්ධව ඉදිරිපත් කර ඇති නීති කෘතිය අවසන් වූ වහාම උසාවි නඩු වාර්තාවේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කරන්න" යනුවෙනි. විශ්‍රාම යාමෙන් පසුව නඩුව අවසන් වුවහොත් එය ඉදිරිපත් කිරීමෙන් පලක් නැති බව හෝ ඉදිරිපත් නොකළ යුතු බව එහි දක්වා නැත. 2014.09.30 දින අවසන් වූ නඩුවේ වාර්තාව මසක් යන්නටද ප්‍රථම 2014.10.20 දින පිළිගත් ක්‍රම වේදයට අනුව සේව්‍ය පාර්ශ්වය වෙත යොමු කර තිබේ.

දෙවන පාර්ශ්වය පළමු පාර්ශ්වයෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී විශ්‍රාම ගිය පුද්ගලයකුට යළි රැකියාව ලබා දීමට හැකියාව නැතිබව පැහැදිළි කර ඇතත් චෝදනාවෙන් නිදොස් කොට නිදහස්ව ඇති තම සේවකයාට රැකියාව ලබා දීමට අවකාශ නොමැති බව හෝ සැළසිය හැකි වෙනත් සහනයක් දක්වා පිළිතුරක් ලබා දෙන්නට පැවති යුතුකම සහ වගකීම ඉටුකර නැත. එසේම කිසියම් සේවකයකුගේ වැඩ තහනම් කොට නිහඬව සිටිය හැකි බව දක්වන අභිමතයක් සේව්‍ය පාර්ශ්වයකට පවතින බව කාර්මික ආරාවුල් පනත යටතේ දක්වා නොමැත.

වැඩ තහනම් කළ දින සිට විශ්‍රාම ගන්නා වයස සම්පූර්ණවන කාලයට අදාළ හිඟ වැටුප් ලබා දෙන ලෙස ඉල්ලා පළමු පාර්ශ්වය නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස්වරයා වෙත 2016.03.30 දින පැමිණිලි කර තිබේ. ඒ අනුව උප ගොනු අංක සීඊ/ඩී9/131 බී/2016 යටතේ පරීක්ෂණයක් සිදු කර තිබේ. එම පරීක්ෂණ අංක යොමුව දක්වමින් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ලිපි ශීර්ෂය යටතේ එහි ප්‍රධාන නීති නිලධාරි රුවිරාණි ජයකොඩි යන මුද්‍රාව සහිත එහෙත් දිනයක් රහිත පිටු තුනක විස්තරාත්මක ලිපියක් එම පරීක්ෂණය සඳහා ඉදිරිපත්කර ඇත. එහි අංක 02 යටතේ ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ගැන මෙසේ දක්වා තිබේ. (සීඊ/ඩී9/131 බී/2016 ලිපි ගොනුවේ පිටු අංක 37, 38, 39)

2.1 "ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථා මාලාව අනුව සාපරාධී නඩුවක විත්ති කරුවකු වී චෝදනාවෙන් නිදහස් වූවකුට වැටුප් ගෙවීම හෝ පසු වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන නොමැති හෙයින් ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන අදාළ කර ගැන්ම සම්බන්ධව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගෙන් උපදෙස් විමසා ඇත. එයට පිළිතුරු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් වෙත 2017.07.31 දින යොමු කර ඇති බවත්

2.2 එකී ලිපියේ සඳහන් කරුණු අනුව වේතන නොගෙවා රඳවා තබා ගන්නා වැටුප් පිළිබඳව විනය බලධාරියාට තීරණයක් ලබා දිය හැකි බව දන්වා ඇති බවත් පැහැදිළිකර ඇත.

2.3 ඉහත කරුණු මත ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවේ මෙවැනි සාපරාධී නඩුවක විත්තිකරුවකු වී චෝදනා වලින් නිදොස් කොට නිදහස් වූ අයෙකුට වැටුප් හා පසු වැටුප් ගෙවීම සඳහා ප්‍රතිපාදන නොමැත, එබැවින්...... "

දෙවන පාර්ශ්වය දක්වන ආකාරයට රාජ්‍ය පරිපාලන ලේකම්වරයා ලබා දී ඇති උපදේශය වන්නේ විනය බලධාරියාට මෙවන් පුද්ගලයකු ගේ හිඟ වැටුපක් ගෙවීම සම්බන්ධයෙන් තීරණයක් ගත හැකි බවය.

දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති ලිඛිත දේශනයේ අංක 36 රෝම ඉලක්කම් 4 හි මෙසේ දක්වා ඇත

> "2001.12.13 දින සිට 2009.08.05 කාලය තුළ පළමු පාර්ශ්වයට එරෙහිව මහාධිකරණ නඩුවක් පැවති අතර ඉල්ලුම්කරු සේවයට වාර්තා නොකළ හෙයින් එසේ සේවයට වාර්තා නොකොට සිය හිඟ වැටුප් ලබා දීමට නෛතික පසුබිමක් නොමැති බවත්.."

එහෙත් ලංගම විනය ව්‍යවස්ථා මාලාවේ අංක 06 යටතේ දක්වා ඇත්තේ චූදිත සේවකයා මුළුමනින්ම චෝදනා වලින් නිදහස් වුවතොත් නියමිත බලධාරියා විසින් සේවකයා වහාම සේවයේ ප්‍රතිස්ථාපනය කිරීමටත් සේවය තහනම් කර සිටි කාලය තුළදී නොගෙවන ලද සම්පූර්ණ වැටුප ගෙවීමටත් නියෝග කළ යුතුය යනුවෙනි.

ඒ අනුව අදාළ පාර්ශ්වය තමා නිදහස්ව ඇති බව දක්වන නඩු වාර්තාව රැගෙන විශ්‍රාම වයස සපිරෙන්නට ආසන්න දිනයක පළමු පාර්ශ්වය කාර්යාලයට පැමිණියා නම් ඔහු සේවයේ පිහිටුවා සියලු හිඟ වැටුප් ගෙවන්නට සිදුවන බව විනය ව්‍යවස්ථාව පැහැදිළි කරයි. එහෙයින් නඩු තීන්දුව ප්‍රමාද වීම මෙම සේවකයාගේ පාලනයෙන් පරිබාහිර කරුණක් වන හෙයින් එය පදනම් කරගෙන පළමු පාර්ශ්වකරුට හිඟ වැටුප් අහිමි කිරීම සාධාරණත්වයට පිටු පෑමකි.

එහෙයින් කම්කරු කොමසාරිස්වරයා විමසන පරිදි 2001.12.13 සිට වැඩ තහනම්කර ඉන් ඔබ්බට කිසිදු පියවරක් ගෙන නොතිබීමෙන් සහ වැඩ තහනමට හේතු වූ චෝදනාවෙන් අධිකරණය විසින් නිදොස් කොට නිදහස් කර ඇති බව දැනුම් දී තිබියදී 2001.12.13 දින සිට 2009.08.05 දින දක්වා හිඟ වැටුප ලබා නොදීමෙන් සේවකයාට අගතියක් සිදුව ඇත.

කම්කරු කොමසාරිස්වරයා වෙත යොමු කර ඇති පළමු පාර්ශ්ව කරුගේ 2023.03.02 දින දරන ලිපියේ ( ඒ 26/2013 නඩු ගොනුව පිටු අංක 10) 11 ඡේදයෙන් ඉල්ලා ඇත්තේ වැඩ තහනමට ලක් වූ 2001.12.23 සිට විශ්‍රාම වයසට එළඹෙන 2009.08.05 දින දක්වා තමාට හිමිවිය යුතු හිඟ වැටුප ලබාදෙන ලෙසය.

ශ්‍රී ලංගම මූල්‍ය කළමනාකරු විසින් කම්කරු කොමසාරිස් කාර්යාලය වෙත ලැබෙන්නට සළස්වා ඇති ඔහුගේ 2023.08.02 දිනැති ලිපියෙන් (ඒ/26/2023 නඩු ගොනුවේ 84 පිට) කේ. ඒ. ආර්. පෙරේරා නමැති අයගේ 2001 ඔක්තෝබර් මූලික වැටුප රු. 5250.00 ක් බවත් මාසික දීමනාව රු. 1000.00 ක් බවත් (එකතුව රු. 6250.00) දන්වා ඇත.

නිදහස් සහ නිදොස් පුද්ගලයෙකු බවට පත් පළමු පාර්ශ්වය තමාගේ සේවය තහනම් කරන ලද ලිපියේ සඳහන් නියමයන්ට අනුකූලව කටයුතු කර ඇති හෙයින්ද, පළමු පාර්ශ්වය නෛතික වශයෙන් විශ්‍රාම ගන්වන්නට දෙවන පාර්ශ්වය කටයුතු කර නොමැති හෙයින්ද රාජ්‍ය පරිපාලන ලේකම්වරයා මෙවන් පුද්ගලයෙකු ගේ හිඟ වැටුපක් ගෙවීම සම්බන්ධයෙන් විනය බලධාරියාට තීරණයක් ගත හැකි බවට උපදෙස් ලබා දී ඇති හෙයින්ද බේරුම්කරණයකින් ලබාදෙන ප්‍රදානයක් වලංගු ගිවිසුමේ ව්‍යවස්ථාපිත නියමයක් බවට පත්වන බව කාර්මික ආරාවුල් පනතේ අංක 19 යටතේ දක්වා ඇති හෙයින් ද,

පළමු පාර්ශ්වය වැඩ තහනමට ලක්කළ 2001.12.03 දින සිට ඔහුගේ විශ්‍රාම වයස එළඹෙන 2009.08.05 දින දක්වා.

| | |
|---|---|
| 2001 දෙසැම්බර් මස වැටුප | රු. 6250.00 |
| 2002 මාස 12 වැටුප | රු. 75 000.00 |
| 2003 මාස 12 වැටුප | රු. 75 000.00 |
| 2004 මාස 12 වැටුප | රු. 75 000.00 |
| 2005 මාස 12 වැටුප | රු. 75 000.00 |
| 2006 මාස 12 වැටුප | රු. 75 000.00 |

| | |
|---|---|
| 2007 මාස 12 වැටුප | රු. 75 000.00 |
| 2008 මාස 12 වැටුප | රු. 75 000.00 |
| 2009 ජන - සිට ජූලි මාස 07 වැටුප | රු. 43, 750.00 |
| එකතුව (මාස 92) වැටුප | රු. 575,000.00 |

වනසේ ගණනය කොට මෙම ප්‍රදාන නියෝගය *ගැසට්* පත්‍රයේ පළකර ලිත් මාසයක් ඉක්ම යන්නට පෙර රු. පන් ලක්ෂ හැත්තෑ පන් දහසක් (රු. 5.75,000.00) වන හිඟ වැටුප කේ. ඒ. ආර් පෙරේරා යන අයගේ නමින් නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් කාර්යාලයේ තැන්පත් කරන ලෙස දෙවන පාර්ශ්වය වන ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට නියම කරමි.

වාර්ෂික වැටුප් වර්ධකය ඒ ඒ වර්ෂවලදී සේවකයෙකු විසින් උපයා ගත යුත්තක් වන හෙයින් එය ගෙවන ලෙස නියම කරනු නොලැබේ. ව්‍යවස්ථාපිත දීමනා සම්බන්ධයෙන් ප්‍රදානයක් සිදු නොකරන අතර ඊට අදාළව කම්කරු කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවනු ඇත.

මෙය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව තවදුරටත් ප්‍රකාශ කරමි.

සිරි සිංගප්පුලි (එල්. එල්. බී.)
බේරුම්කරු

EOG 02 - 0032

---

*මගේ අංකය*: IR/COM/03/2020/163.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.01.09 දිනැති හා අංක 2314/04 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.01.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාළඹේ, ගෝනවත්ත පාර, අංක 1000/17 ලිපිනයෙහි පදිංචි බන්දුල පද්මසිරි ගමාරච්චි මයා සහ මාකොළ, සපුගස්කන්ද ලිපිනයෙහි පිහිටි ලංකා ඉන්ඩස්ට්‍රියල් එස්ටේට්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/08/2023 හා 2023.11.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වන වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් (රා.ආ.).

2024 ජනවාරි මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

අයි ආර් ගොනු අංක : අයි/ආර්/කොම්/03/2020/163.
*බේරුම්කරණ නඩු අංකය:* ඒ/08/2023.

බන්දුල පද්මසිරි ගමාරච්චි මයා,
අංක 1000/17, ගෝනවත්ත පාර,
මාළඹේ.

*පළමු පාර්ශ්වය*

**එදිරිව**

ලංකා ඉන්ඩස්ට්‍රියල් එස්ටේට්ස් ලිමිටඩ්,
සපුගස්කන්ද,
මාකොළ.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා ආමාත්‍ය, මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 දරන හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රති සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පැලවත්ත, සිංහපුර පාරේ අංක 117හි පදිංචි සිරි සිංගප්පුලි වන මා පත් කොට ඇත.

**බේරුම් කළයුතු කරුණු :-**

කම්කරු කොමසාරිස් ජනරාල්වරයා යොමු කර ඇති ඔහුගේ අංක අයිආර්/කොම්/03/2020/163 සහ 2022.12.26 දිනැති ලිපිය අනුව බේරුම් කළ යුතුව ඇති කරුණු වන්නේ බන්දුල පද්මසිරි ගමාරච්චි මහතාට එවකට දීර්ඝ කාලයක් පුරා ආයතනයේ තිබූ පිළිගත් ක්‍රමවේදයන් අනුව භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු සඳහා දීමනා හිමිද හිමි නම් එය ලබා නොදී තිබීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ලැබිය යුතු සහනයන් මොනවාද යන්නත් පිළිබඳව වේ.

**පාරශවයන් වෙනුවෙන් පෙනීසිටීම**

අදාළ බේරුම්කරණ නඩුවේදී ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරුවන බන්දුල පද්මසිරි ගමාරච්චි යන අය ද දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීතීඥ මනෝලි ජිනදාස, නීතීඥ ඩිලිනි රිච්ස් යන අයද පෙනී සිටින ලදී.

**ආරාවුලේ පසුබිම:-**

මෙම ආරාවුල සම්බන්ධයෙන් තමන්ට ඉදිරිපත් කරන්නට ඇති කරුණු පරීක්ෂණ දිනට පෙර ඉදිරිපත් කරන ලෙසත්, 2023.02.21 වැනි දින පෙ.ව. 10.00ට බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය හමුවේ පෙනී සිටින ලෙසත් කම්කරු කොමසාරිස්වරයා ඔහුගේ 2023.02.03 දින දරන ලිපිය මගින් දෙපාර්ශ්වයටම දන්වා තිබුන ද ඒ අනුව කරුණු ඉදිරිපත්කර තිබුනේ සහ නඩු විභාගය සඳහා සහභාගි වී සිටියේ දෙවන පාර්ශ්වය පමණි.

2023.03.17 වැනි දින පැවති දෙවන නඩු විභාග දිනය හමුවට පළමු පාර්ශ්වකරු, පැමිණ සිටි අතර තමා විදේශ ගතව සිටි හෙයින් අධිකරණයට ඉදිරිපත්වන්නට නොහැකිවූ බව පවසා සිටියේය. තම පළමු ප්‍රකාශය සතියක් තුළ ඉදිරිපත් කර එහි පිටපත් දෙවන පාර්ශ්වය වෙත ලබා දෙන ලෙස දැනුම්දුන් අතර එම ලිපිය 2023.04.03 දින බේරුම්කරණ අංශය වෙත ලැබී තිබුණි.
තමා දෙවන පාර්ශ්වයට අයත් (ලින්ඩල්) ආයතනයේ 2014.06.24- 2019.09.30 අතර කාලයේ කොන්ත්‍රාත් පදනම යටතේ ගණකාධිකාරී, මූල්‍ය පරිපාලක සහ මුල්‍ය අංශ ප්‍රධානි යන තනතුරුවල කටයුතු කොට ගිවිසුම් කාලය අවසන් වීම මත 2019.09.30 දින සේවයෙන් ඉවත්වූ බව එහි දක්වා ඇත.

මෙම ආයතනය 2005 වසරේ පමණ සිට භාවිතා නොකර ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු සඳහා ''මසකට රාජකාරි දින 22ක් ඇත'' යන පදනම මත එහි සේවකයකු සේවය නිම කරන විටදී හෝ විශ්‍රාම යන විටදී ඒ වෙනුවට මුදල් ගෙවන ක්‍රමවේදයක් පැවතුන බව දක්වා තිබේ. සේවයෙන් ඉවත්වූ තමා වෙත මෙම මුදල ගෙවා නොමැති බව ඔහු දක්වයි.

ඒ අනුව ඊට අදාළව තමාට හිමි රු.74.480.00ක මුදල ගෙවන මෙන් ආයතනයේ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා, ආයතනයේ සභාපති ලෙස කටයුතු කළ පුද්ගලයා සහ ආයතනය අයත් සමූහ ව්‍යාපාරයේ දුක්ගැනවිලි කමිටුව ආදියෙන් තමා සේවයෙන් ඉවත්ව යාමෙන් දින කිහිපයකට පසු 2019 ඔක්තෝබර් 04 දින ලිඛිතව ඉල්ලා ඇත.

ඒ කිසිවකට ප්‍රතිචාර නොලත් හෙයින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඒ සම්බන්ධයෙන් පැමිණිලිකළ බව දක්වා තිබේ.

ඔහු දක්වන්නේ 2019 අගෝස්තු මස 27 හා/ හෝ සැප්තැම්බර් මස පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී මෙවන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් නිසි අයුරින් ඉදිරිපත් නොකළ බවත් ඉදිරිපත්කළ ව්‍යාජ එනම් අනිසි පත්‍රිකාවද එහි වූ තාක්ෂණ දෝෂ හේතුවෙන් සම්මත නොවූ බවත්ය.

එවැන්නක් සම්මත කර ඇතැයි උපකල්පනය කළද එවන් තීරණයක් ගැන තමා විශ්‍රාම ගන්නා තෙක්ම ඒ සම්බන්ධයෙන් දැනුවත් කර නොමැති බවය. මෙය තමාට හිමිවිය යුතු වරප්‍රසාද අහිමි කිරීමේ චේතනාවෙන් කළ කටයුත්තක් බව තවදුරටත් දක්වා ඊට අදාළ රු. 74,480.00 මුදල ලබාදෙන ලෙස කම්කරු කොමසාරිස් වරයාගෙන් ඉල්ලා තිබේ.

දෙවන පාර්ශ්වය පළමු ප්‍රකාශයෙන් දක්වා ඇත්තේ වාර්ෂිකව අළුත් කරන සේවා ගිවිසුමක් යටතේ ඩීඑෆ්සීසී පීඑල්සී ආයතනයෙන් විශ්‍රාම ගෙන සිටි පළමු පාර්ශ්වකරු සිය ආයතනයේ ගිණුම් අංශයේ සේවයට 2014 දී බඳවා ගෙන ඇති බවත් 2019.09.30 දින ඔහු සමඟ පැවති සේවා ගිවිසුම අවසන් කළ බවත් සේවකයකු විශ්‍රාම ගන්නා විට හෝ සේවයෙන් ඉවත් වන විට භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවන වැඩපිළිවෙලක් ආයතනයේ ක්‍රියාත්මකව පැවති බවත් එය 2019.08.26 දින අංක 03/19 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 2019.08.27 දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කිරීමෙන් අනතුරුව 2019.09.01 දින සිට බලපවත්වන පරිදි අක්‍රිය කරන ලද බවත්ය.

ඉන් අනතුරුව සමූහයේ අනෙකුත් අනුබද්ධ සමාගම්වලට සමානව සමාගමේ මව් සමාගම DFCC බැංකු PLC ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි මුදල් ප්‍රතිලාභ ගෙවීම පිළිබඳ නව ප්‍රතිපත්තියකට අනුගත වූ බවත්, ඒ අනුව 2019.09.01 දින සිට වසරක දෙසැම්බර් මස 31 දක්වා සේවයේ යෙදුනු ස්ථිර සේවකයින්ට පමණක් දින 14 ක උපරිමයකට යටත්ව භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු මුදල් කර ගැනීමේ හිමිකම ස්ථාපනය කර ඇති බවත් දක්වා ඇත. ඒ අනුව දෙසැ. 31 වැනි දිනට පෙර විශ්‍රාම ගන්නා හෝ සේවයෙන් ඉවත්වන සේවකයෙකු ඊට හිමිකම නොලබන බව දක්වා තිබේ.

දෙවන පාර්ශ්වය තවදුරටත් දක්වන්නේ එකී නව ප්‍රතිපාදනය අනුව 2019.09.30 දින ගිවිසුම්ගත සේවයෙන් සමුගත් පළමු පාර්ශ්වය භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු මුදල් කරගැනීමේ හිමිකම නොලබන බවයි.

**බේරුකරණ අධිකරණය සළකා බලා ඇති කරුණු**

*(අ)* ගැටළුව විසඳීමේදී සළකා බැලිය යුතු සාධක වන්නේ පළමු පාර්ශ්වය විශ්‍රාම යන දිනය වන විට කොන්ත්‍රාත් පදනම යටතේ සේවයේ යෙදී සිටි පුද්ගලයිනට වුවද භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු වෙනුවෙන් මුදල් ලබාගත හැකි ක්‍රමවේදයක් හෝ වලංගු නෛතික ප්‍රතිපාදනයක් ආයතනය තුළ ස්ථාපිතව පැවතියේ ද යන්න.

*(ආ)* (අ) යන්නෙන් දැක්වෙන ප්‍රතිපාදනය පළමු පාර්ශ්වය විශ්‍රාම යන අවස්ථාව වන විටත් බල පැවැත්වුනාද එසේත් නැත්තම් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් ඒ වන විට එම නෛතික ප්‍රතිපාදනය හෝ ක්‍රමවේදය වෙනසකට භාජනය කර හෝ අහෝසි කර තිබුනාද යන්න ; සහ

*(ඇ)* පළමු පාර්ශ්වයට හිමි වරප්‍රසාද අහිමි කිරීමේ චේතනාවෙන් භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ලබාගන්නට හැකිව පැවති ක්‍රමවේදය අහෝසි කිරීමට දෙවන පාර්ශ්වය කටයුතු කර ඇත්ද යන කරුණු ය.

'අ' සළකා බැලීම

දෙවන පාර්ශ්වයේ ප්‍රශ්ණ කිරීම හමුවේ පළමු පාර්ශ්වකරු පිළිතුරු දෙයි. (2023.06.19 නඩු විභාග සටහන් 11 වන පිට)

ප්‍ර. මෙම X1 ලේඛනය අනුව සෑම වර්ෂයක් අවසානයේදීම තමුන් ඉල්ලීමක් කළාද වෛද්‍ය නිවාඩු මුදල් කරන්න

පි. එසේය, ස්වාමීනි.

ප්‍ර. ඒ වගේම ඒ සෑම අවස්ථාවේදීම ආයතනය විසින් තමුන්ගේ පැවරුම් ලිපියේ ඒ සඳහා කොන්දේසියක් නොමැති වුවත් ඒ සඳහා තමන්ට එම නිවාඩු මුදල් කර ගැනීමට අවසර දුන්නා. ඒක තමුන් පිළිගන්නවද ?

පි. ඔව්..................

කොන්ත්‍රාත්තුවකට අනුගතව සිටි පළමු පාර්ශ්වය සමග අත්සන් කරන ලද වාර්ෂික ගිවිසුම් තුළ භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු වෙනුවෙන් පළමු පාර්ශ්වය වෙත මුදල් ගෙවන බවට සුවිශේෂ කොන්දේසියක් අන්තර්ගතව නැතද? සමස්ත කාර්ය මණ්ඩලයටම බලපාන එවන් ක්‍රමවේදයක් 2019 අවසන් භාගය වන තෙක්ම ආයතනය තුළ ක්‍රියාත්මක පැවති බව දෙපාර්ශ්වයම පිළිගන්නා ලදී.

'ආ' සළකා බැලීම

ආයතනය තුළ ක්‍රියාත්මකව පැවති මෙම 08 ක්‍රමවේදය 2019 අගෝස්තු 27 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මගින් අවලංගු කර ඇති බව දෙවන පාර්ශ්වය පවසා සිටියද 2019 අගෝස්තු හා/හෝ සැප්තැම්බර් මස පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී මෙවන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් එලෙස නිසි අයුරින් ඉදිරිපත් නොකළ බවත් ඉදිරිපත් කළ ව්‍යාජ එනම් අනිසි පත්‍රිකාවද එහි වූ තාක්ෂණ දෝෂ හේතුවෙන් සම්මත නොවූ බවත් පළමු පාර්ශ්වය සිය පළමු ප්‍රකාශයෙන් පවසා තිබේ.

''එසේ සම්මත වූවායැයි උපකල්පනය කළද " යන වාක්‍ය ඛණ්ඩය පළමු පාර්ශ්වය 2023.03.30 දින ඉදිරිපත් කළ සිය පළමු කරුණු දැක්වීමේ පත්‍රිකාවේ අංක 10 යටතේ මෙසේ දක්වා ඇත. ''මේ පිළිබඳව මා තවදුරටත් කියා සිටින්නේ යම් අයුරකින් ආයතනයේ ප්‍රකාශය නිවැරදියැයි එනම් එවන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් එලෙස නිසි ලෙස සම්මත වූවේයැයි උපකල්පනය කළත් ඒ පිළිබඳ නිසි බලය ලත් පුද්ගලයකු විසින් එම තීරණය සම්බන්ධයෙන් ලිඛිතව සේවක මණ්ඩලය වෙත දැනුම්දීම කළ යුතු වුවත් කිසිම පුද්ගලයකු විසින් මාගේ සේවය අවසන්වූ වර්ෂ 2019 සැප්තැම්බර් මස 30 දින තෙක් එම දැනුම්දීම නොකළ බවත් එසේ කර ඇත්නම් එය ඔප්පු කිරීමේ භාරය ආයතනය සතු වන බවත්ය.''

එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණය සම්බන්ධයෙන් සිදු කර ඇති සඳහන අනුමාන වශයෙන් දක්වන ලද කරුණක් ලෙස මිස ප්‍රබල පදනමක් සහිත තර්කයක් ලෙස ගොඩනැගෙන්නේ නැත. තමා දක්වන පරිදි එවැනි තීරණයක් 2023 අගෝස්තු හෝ සැප්තැම්බර් මාසවලදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නොගත්තේය යන සාධකය නඩු විභාගය හමුවේ සැකයකින් තොරව ඔප්පු කිරීම පළමු පාර්ශ්වය සතු ප්‍රබලතම භාරය විය.

2023.09.26 වැනි දින පැවති නඩු විභාගයේදී පළමු පාර්ශ්වයේ සාක්ෂිකරුවකු ලෙස කැඳවා සිටි ආයතනයේ ප්‍රධාන විධායක නිළධාරි බුලත්සිංහලගේ රසික චමින්ද නමැති අය සාක්ෂි ලබාදෙමින් ප්‍රශ්ණගත මෙම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව තමන් විසින් අත්සන්කොට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර ඉදිරිපත්කළ බව පැවසීය. (2023.09.26 සාක්ෂ සටහන්වල 19 සහ 20 පිටු)

ප්‍ර. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව තමන් අත්සන් කළා කියල ප්‍රකාශ කළා නේ ?

පි. ඔව්

ප්‍ර. තමුන්ට යෝජනා කරනව එම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව පළමු වතාවට දුටුවේ කියල

පි. නැත. අපි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කරන්නෙ රැස්වීම පැවැත්වීමට සතියකට දෙකකට කලින්

අධිකරණය

ප්‍ර. ඔබ අත්සන් කරල ඉදිරිපත් කළා?

පි. ඔව්

......................

ප්‍ර. සාක්ෂිකරු මම තමන්ට යෝජනා කරනව මෙම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත්කරන අවස්ථාවෙ තමුන් මෙය දැක තිබුනේ නැහැ, එහි අත්සන් කරල තිබුනෙත් නැහැ කියල?

පි. ප්‍රතික්ෂේප කරනව. එය සම්පූර්ණ වැරදි ප්‍රකාශයක්

ප්‍ර. තමුන්ට මම යෝජනා කරනව ගරු බේරුම්කරණය ඉදිරියේ ප්‍රතිඥා දී අසත්‍ය ප්‍රකාශ කරන බව

පි. කොහෙත්ම නැහැ

ප්‍ර. මෙම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ තමුන් සඳහන් කළා ගැටළු සහගතව ආව 2.3 වගන්තිය ගැන

පි. සඳහන් කළා

ප්‍ර. මට කියන්න සාක්ෂිකරු ඉන්පසු ඉදිරිපත් කළ ආර්4 ඒ කියන එවකට සමාගමේ සමාගම් ලේකම් සමිත්‍රි කාරියවසම් මහත්මිය ඉදිරිපත් කරල තියෙන මෙම උධෘතය පරිද්දෙන් තමුන්ට දැනෙන විදිහට මොකක්ද සඳහන් කරල තියෙන්නෙ

පි. 2.3 තියෙන්නෙ වෛද්‍ය නිවාඩු ඉදිරියට ගෙනයාම පිළිබඳව අවලංගු කළා කියල

ප්‍ර. ක්ලැරිෆිකේෂන් එක ගන්න ඕන කව්ද?

පි. මම

ප්‍ර. රසික බුලත්සිංහල කියන පුද්ගලයා එවකට සිටි අයෙක් කියල මේ ලියවිල්ලෙ තියනවද?

පි මෙම බෝඩ් පේපර් එක ඉදිරිපත්කළේ මම

පළමු පාර්ශ්වයේ සාක්ෂිකරුවකු වන ලින්ඩල් ආයතනයේ මල්ටිඩියුටි එක්සිකිටිව් සපරමාදු මහබල මායාදුන්න ගේ ප්‍රදීප් වසන්ත කුමාර 2023.07.11 දින විභාගයේදී එම පාර්ශ්වයේ මෙහෙයුම යටතේ සාක්ෂි ලබා දුන්නේය. (2023.07.11 දින සාක්ෂි සටහන් 5 සහ 6 පිටු)

ප්‍ර. ඔබතුමා දන්නා ආකාරයට ප්‍රකාශ කරන්න යම්කිසි සේවකයෙක් ස්වේච්ඡාවෙන් සේවයෙන් ඉවත්වන අවස්ථාවේදී හෝ අවු. 55 න් සේවයෙන් ඉවත්වන අවස්ථාවේදී හෝ එහෙමත් නැති නම් වාර්ෂික කොන්ත්‍රාත්තුව නිමවීමෙන් පසුව සේවයෙන් ඉවත්වන විට තමුන් විසින් උපයාගත් නිවාඩු සඳහා මුදල් ගෙවන ක්‍රමවේදයක් එමකාල වකවානුව තුළ තිබුන බව මහත්තයාට ප්‍රකාශ කරන්න පුළුවන්ද?

පි. 2019 ඔක්තෝබර්වලින් පස්සෙ කිසි කෙනෙකුට වෛද්‍ය නිවාඩුවලට ගෙවීම් නොකරන බව දැනුම් දුන්නා

ප්‍ර. කොයි කාලෙද ?

පි. මට මතක හැටියට 2019 අගෝස්තු මාසයේ සිට ගෙවීම් නොකරන බව ආයතන ප්‍රධානියා දැනුම් දුන්නා

අධිකරණය

ප්‍ර. චක්‍රලේඛයකින් දැනුම් දුන්නා ද?

පි. වාචිකව. ලින්ඩල් ආයතනයේ වෙයාමන් පැමිණියා. අපි භාරව ඉන්න ශාන් මහත්තයයි ඒ දෙන්නම බෝඩ්රූම් එකේ සාමාන්‍ය රැස්වීමක් කැඳවලා එතුමා ප්‍රකාශ කළා ෂෙඩියුල් වෙනස් කරනව කියල. මෙඩිකල් ලීව් සඳහා ගෙවීම නොකරන බව ප්‍රකාශ කලා. පසු දවසක ප්‍රධාන විධායක නිලධාරි රසික කුරේ මහතා කිව්ව බෝඩ් පේපර් එකක් දාල තියෙන්නෙ රිසයින් වෙන අයට මෙඩිකල් ලීව් හදන්න එපා කියල. මම තමයි ලීව් හදල දෙන්නෙ. අපේ ප්‍රධාන විධායක නිලධාරිගෙන් ඇහුවාම කිව්ව කෙනෙක් අයින් වෙන කොට මෙඩිකල් ලීව් ගෙවන්නෙ නෑ කියල. වාර්ෂික නිවාඩුවලට ගෙවනව කියල කිව්වා ඉන් පසුව කිහිපදෙනෙක්ම රිටයර් වුනා. මමත් කොන්ත්‍රාත් පදනමින් ඉන්නෙ. මටත් ගෙව්වේ නැහැ. කිසිම කෙනෙකුට වෛද්‍ය නිවාඩු සඳහා ගෙව්වෙ නැහැ.

ප්‍ර. කවද්ද ඉවත්වුනේ 2022

ප්‍ර. තමුන් මම අහන ප්‍රශ්නයට නෙමේ උත්තර දුන්නෙ. තමුන් අදහස් කරන විදිහට ඔක්තෝබර් මාසේ ඔබතුමා දුන්නා කියලා එය නිවැරදිද?

පි. මම පස්සේ කිව්ව අගෝස්තු කියල

ප්‍ර. සාක්ෂිකරු තමාගෙ හිතේ තිවැරදි දේ තමයි තමුන්ට කියවෙන්නෙ. තමුන්ට කියලා දුන් දේ තමයි අසත්‍ය ලෙස ප්‍රකාශ කරන්නෙ කියල මම තමුන්ට යෝජනා කරනවා.

පි. පිළිගන්නෙ නැහැ

ඇ. සළකා බැලීම

පළමු පාර්ශ්වයේ ප්‍රථම කරුණු ඉදිරිපත් කිරීමේ ලිපියේ අංක 15 යටතේ තමාට හිමිවිය යුතු වරප්‍රසාද අහිමිකිරීමේ චේතනාවෙන් මෙහිදී ආයතනය කටයුතු කර ඇති බව සඳහන් කර තිබේ.

එම පාර්ශ්වයේ ප්‍රථම කරුණු ඉදිරිපත් කිරීමේ ලිපියේ අංක 13 යටතේ දක්වා මෙසේ දක්වා ඇත.

''අංක 13 - 2019 සැප්තැම්බර් යනු ලින්ඩල් ආයතනය තුළ වූ මාගේ අවසන් රාජකාරි මාසය වූ අතර එක් අධ්‍යක්ෂවරයකුගේ ක්‍රියාකලාපය හේතුවෙන් වර්ෂ 2019 අගෝස්තු මස 27 වන දින පැවැත්වීමට නියමිතව තිබී පැවැත්වීමට නොහැකිවූ වාර්ෂික මහ සමුළුව සැප්තැම්බර් මස පැවැත්වීමට අදාළ දායකත්වය ලබාදීම, එහි පසු විපරම, මගෙන් පසු තනතුරට වැඩ භාරගැනීමට පැමිණි නිලධාරියාට අවශ්‍ය උද්ගමනය (ඉන්ඩක්ෂන් ඇන්ඩ් ෆැමිලියරයිසේෂන්) හුරු පුරුදු කර දීම, වඩාත්ම වැදගත් ලෙස එම වසරේ පැවති අභ්‍යන්තර විගණන පරීක්ෂණයට පසුව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සහ/ හෝ ඒ සඳහා ඇවැසි කටයුතු සැකසීම හේතුවෙන් මා හට එම මාසය ඉතා කාර්ය බහුල සමයක් විය......''

එම කරුණුවලින් අනාවරණය වන්නේ විශ්‍රාම ලබාගත් මාසයේ පළමු පාර්ශ්වය සිය ආයතනය තුළ අනලස්ව සහ ලැදියාවකින් කටයුතු කර ඇති බවය.

එසේම ඉහළ කළමනාකරණය පළමු පාර්ශ්වය සමග කිසිදු අකාරයෙක ගැටීමක් හෝ අමනාපයක් ඇතිව සිටි බව එම ප්‍රකාශය තහවුරු නොකරයි. පෙනීයන්නේ කුළුපග භාවයෙන් යුතුව දෙපාර්ශ්වය කටයුතු කර ඇති බවය.

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය හෙවත් ප්‍රදානය**

සෑම වර්ෂයක් අවසානයේදීම වෛද්‍ය නිවාඩු මුදල් කරගැන්ම සඳහා තමා ඉල්ලීමක් කරන බව (2023.06.19 නඩු විභාග වාර්තා සටහන් 11වන පිට) දෙවන පාර්ශ්වයේ ප්‍රශ්ණ  කිරීම හමුවේ ප්‍රකාශ කළද සේවයෙන් ඉවත්ව යන අවස්ථාවේ එවන් ලිඛිත ඉල්ලීමක් කර ඇති බව සනාථ කරනු සඳහා පළමු පාර්ශ්වය කරුණු දක්වා තිබුනේ නැත. එසේ සිදුකළා නම් ආයතනය දක්වන ලද ප්‍රතිචාරය සාක්ෂියක් විය හැකිව තිබුනි.

මූල්‍ය අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කළ හෙයින්, සේවය අවසන් වන විට හෝ විශ්‍රාම ලබන විට ලැබිය යුතු භාවිතා කළ වෛද්‍ය නිවාඩු වෙනුවෙන් ගෙවන මුදල තම 2019 සැප්තැම්බර් මස වැටුප හෙවත් අවසන් වැටුප ලැබෙන විට ලැබෙන්නේද යන්න ගැන වැටුප් සකසන පියවරේ සිටම විමසා බැලීමට පළමු පාර්ශ්වයට කදිම අවස්ථාවක් උදාවී තිබුනි.

එවන් නිරීක්ෂණයක යෙදුනා නම් 2019 අගෝස්තු හෝ සැප්තැම්බර් යන මාසවල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී එවැන්නක් අනුමත නොවූ බවට තමා අධිකරණය හමුවේ කරන ප්‍රකාශය චේතන ලිපිකරු ආදීන්ගේ සාක්ෂි සහිතව තහවුරු කොට අතැඹුලක් සේ නඩුව ජය ගන්නට පළමු පාර්ශ්වයට ඉඩ තිබුනි. පළමු පාර්ශ්වය එවන් විමසා බැලීමකට අනුගත වූ බවක් දක්වා නැත.

සිය පළමු ප්‍රකාශයේ අංක 13 යටතේ පළමු පාර්ශ්වය දක්වන්නේ විශ්‍රාම ගිය 2019 සැප්තැම්බර් මාසය අතිශය කාර්ය බහුල කාලයක් වූ හෙයින්''....... රාජකාරි දින 19 කට සීමා වූ එම මාසය තුළ මා හට වසර මුලදී හිමිවූ වෛද්‍ය නිවාඩු 14 සහ මෙම 2019 වසර තුළ සමානුපාතිකව උපයාගත් වෛද්‍ය නිවාඩු 10 සහ 1/2 ත් මොනම හේතුවක් නිසාවත් ලබා ගත නොහැකිවන ආකාරයේ සදාචාරාත්මක වගකීමක් මා වෙත වූ බව සඳහන් කරණු කැමැත්තෙමි'' යනුවෙනි. සම්පූර්ණ සේවක සංඛ්‍යාව 15 පමණ වන ආයතනයක් තුළ තමන්ට හිමි දීමනා ලැබීම/ නොලැබීම ගැන සේවයෙන් සමුගන්නා පුද්ගලයකු අවසන් මාසයේ අවසන් මොහොතේ හෝ විමසා නොබැලීම සදාචාරාත්මක වගකීම යන වදනකින් යටපත් කළ නොහැක.

පළමු පාර්ශ්වය ඉදිරිපත් කර ඇති මූලික ප්‍රකාශයේ අංක 5 යටතේ දක්වා ඇති ආකාරයට මෙම සිද්ධියට අදාළ  දීමනාව ලබාගන්නේ හෝ ලබාදෙන්නේ සේවය නිම කරන විටදී හෝ විශ්‍රාම යන විටදී මිස ඊට පෙර හෝ පසුව නොවේ. විශ්‍රාම යාමත් සමගය. එකී සුදුසු අවස්ථාවේ පියවර ගැනීමේ පරම වගකීම එම පාර්ශ්වය සතුය. එම කාලය තුළ ඒ ගැන නොසොයා නිශ්ශබ්ද පිළිවෙතක් අනුගමනය කර තිබීමත් සේවයෙන් ඉවත්ව බැහැරට ගොස් 2019 ඔක්තෝබර් 04 වන දින දරන ලිපියක් මගින් එකී දීමනාව ඉල්ලා සිටීමත් එකට ගැට ගැහී ඇති සාධක යුගලක් බව පෙනේ.

2023.06.19 වැනි දින නඩු විභාගය හමුවේ ප්‍රශ්නගත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අදාලව දෙවන පාර්ශ්වය පළමු පාරශ්වයෙන් ප්‍රශ්නකර සිටියේය. (23.06.19 දින නඩු විභාග සටහන් 17 වන පිටුව)

ප්‍ර. තමුන් ඉදිරිපත්කළා මේ X3 වශයෙන් මෙම ගරු අධිකරණයට නිවැරදි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මෙම ගරු බේරුම්කරණ අධිකරණය ඉදිරියේ ලකුණු කළ R4 ලේඛණය නොව වෙනත් ලේඛණයක් කියා?

පි. එය ඉදිරිපත් කර තිබෙනවා ස්වාමීනි, දැනටමත්

ප්‍ර. මහත්මයා දැන් X3 කියලා තමුන් සත්‍යයයි කියන මේ ලේඛණයේ 2.3 වශයෙන් කියන වගන්තිය හා R4 කියාලා නිසි ලෙස සමාගම් ලේකම්වරිය විසින් සහතික කරන ලද වගන්තිය අතර කිසිදු අසමානතාවයක් නැහැ කියලාත් මම තවදුරටත් යෝජනා කරනවා.

පි. ස්වාමීනි, මම කළිනුත් ප්‍රකාශ කළා අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව බෙදාහැර ඇති අවස්ථාවේදී මෙය අත්සන් කර ඇති පුද්ගලයා ඒ අවස්ථාවේදී අත්සන් කරල නැති බව ස්වාමීනි. මගේ ස්ථාවරය දැනටත් එසේමයි. ඉන් පසුව කුමන හෝ පදනමක් මත එම අත්සන ලබාගෙන තියෙනවා ස්වාමීනි. ඒ අනුව මෙම ලේඛණය ප්‍රතික්ෂේප කරනවා. එමෙන්ම ඒ පිළිබඳව සාක්ෂි දීමටත් මා ප්‍රතික්ෂේප කරනවා ස්වාමීනි.

මේ අනුව දෙවන පාර්ශ්වය ඉදිරිපත්කරන R4 නමැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව පසුව අත්සන් තබා ඇති එකක් බව දක්වමින් පළමු පාර්ශ්වය දැඩි සේ ප්‍රතික්ෂේප කළද එය තමා කැඳවන ලද සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මගින් හෝ වෙනත් සාධක මගින් සැකයකින් තොරව ඔප්පු කරන්නට පළමු පාර්ශ්වය සමත්වූයේ නැත.

2023.05.29 වැනි දින පැවති නඩු විභාගය හමුවේ මෙම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කළේ කවරෙක්ද යන්න අධිකරණය පළමු පාර්ශ්වයෙන් විමසීය. (2023.05.29 නඩු විභාග සටහන් 6 පිට)

**අධිකරණය**

ප්‍ර. කව්ද එතකොට එම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත්කළේ ?

පි. රසික කළංසූරිය නමැති පුද්ගලයෙක්. මම හිතනවා ඔහු තවමත් ඇති කියල. මම ඔහුවත් සාක්ෂියට කැඳවන්න බලාපොරොත්තු වෙනව.

එහෙත් පළමු පාර්ශ්වය එවන් සාක්ෂිකරුවකු බේරුම්කරන අධිකරණය හමුවට ඉදිරිපත් කළේ නැත.

එසේම පළමු පාර්ශ්වය විසින් බේරුම්කරණය හමුවට ඉදිරිපත් කරන ලද 2019.08.26 දිනය සහිත කිසිවකුගේ අත්සන හෝ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංකයක් රහිත X3 නමැති ලියවිල්ල සත්‍ය ලේඛණය බවට ප්‍රකාශ කළද හුදු ඡායා පිටපතක් පමණක් වන එම ලේඛණයේ වලංගුභාවය, සහ නෛතික භාවය සාක්ෂි හෝ සාධක මගින් සනාථ කෙරුනේ නැත. සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරි ආදීකොට ඇති ඉහළ කළමනාකරණය පළමු පාර්ශ්වය සමඟ උරණව හෝ අමනාපයෙන් කටයුතු කර ඇති බවට නඩු විභාගය හමුවේ සාක්ෂි ඉදිරිපත් කර නොමැති හෙයින් ඔහුගේ වරප්‍රසාද අහිමිකිරීමේ චේතනාවෙන් දෙවන පාර්ශ්වය කටයුතු කර ඇති බව සනාථ වන්නේද නැත.

පසිඳලීමක් හමුවට ඉදිරිපත් කරන සද්භාවමය කරුණක් වුවද ලිඛිත සහ වාචික සාක්ෂි මගින් තහවුරු කරන්නට සමත් වන්නේ නම් මිස එය ජයග්‍රහණයෙන් කෙළවර කරගන්නට ඉඩකඩ විවර වන්නේ නැත. මේ සියළු කාරණා සැළකිල්ලට ගෙන බලන විට පළමු පාර්ශ්වය දක්වා ඇති කරුණු සැකයකින් තොරව ඔප්පු කරන්නට සමත්ව නොමැති හෙයින්ද 2019.09.30 දින බන්දුල පද්මසිරි ගමාරච්චි යන අය විශ්‍රාම ගන්නා මොහොත වන විට ආයතනය තුළ ක්‍රියාත්මකව පැවති භාවිතා නොකළ වෛද්‍ය නිවාඩු සඳහා දීමනා ලබාදීමේ ක්‍රමවේදය අංක 03/සහ 2019.08.26 දින දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව 2019.08.27 දින සම්මත කිරීම මගින් යටපත්කර විකල්ප විධිවිධාන බල ගන්වා ඇති බව දෙවන පාර්ශ්වය බේරුම්කරණ විභාගය හමුවේ ඒත්තු ගන්වා ඇති හෙයින්ද පළමු පාර්ශ්වය ඉල්ලා ඇති සහනය ලබා ගැන්මට හිමිකමක් නොලබන බවට තීරණය කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

සිරි සිංගප්පුලි (එල්එල්බී)
බේරුම්කරු ඃ

2023.11.21

EOG02 - 0033

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.